# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2485/54 - 2026 අප්‍රේල් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2026.04.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/80 (35)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ, ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය **නලින්ද ජයතිස්ස,**
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

2026 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2023 පෙබරවාරි මස 14 වැනි දින අංක 2319/41 , දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, කලින් කල සංශෝධිත පරිදි වූ 2022 ආහාර (ට්‍රාන්ස්-මේද) නියෝගවල 8 වන නියෝගයේ “ට්‍රාන්ස් - මේද” යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“ට්‍රාන්ස්-මේද” යන්නෙන්, ඇදුනු ව්‍යුහයක දී ද්විත්ව බන්ධනයක් පවතින අවම වශයෙන් එක් මෙතිලීන් කාණ්ඩයකින්, කාබන් - කාබන්වලින් අඛණ්ඩතාවය බිඳින ලද ප්‍රතිබද්ධවීමක් නොදරන ඒක අසංතෘප්ත සහ බහු අසංතෘප්ත මේද අම්ලවල සියලු ජ්‍යාමිතික සමාවයවිකයන් අදහස් වන අතර එයට -

(අ) සත්ව සම්භවයක් ඇති මේදයේ ස්වභාවිකව ඇතිවන ට්‍රාන්ස් මේදය; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද ට්‍රාන්ස් මේද හැර අනෙකුත් ට්‍රාන්ස් මේද ද,

ඇතුළත් වේ.

EOG 04 - 0166

1A - PG 7602 — 3003 (2026/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*